// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2289/41 - 2022 ජූලි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.සීඑෆ් 1/64.

### (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය සමග කියවිය යුතු, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ, ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති,

2022 ජූලි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

අංක 2289/07 සහ 2022 ජූලි මස 18 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග, එහි 2 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) මේ නියෝගවල "ජනාධිපතිවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය ප්‍රකාරව තෝරා පත්කර ගන්නා ලද ජනාධිපතිවරයා අදහස් වන්නේ ය.".

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 37118 — 366 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*